DOI : 10.31357/fhssmst.2003.00654

# ත්‍රිකුණාමල වරායේ ජාත්‍යන්තර වැදගත්කම

# ත්‍රිකුණාමල වරායේ ජාත්‍යන්තර වැදගත්කම.

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පශ්චාද් උපාධි පීඨයෙහි
ශාස්ත්‍රපති උපාධි පරීක්ෂණය සම්පූර්ණ කිරීම සඳහා
ඉදිරිපත්කෙරෙන පර්යේෂණ නිබන්ධය

07 MAY 2004

17 SEP 2003

එච්. සී. එල්. කල්දේරා
GS/SS/18/96
ඉතිහාස හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

2003

ඉතිහාස හා පුරාවිද්‍යා
අධ්‍යයනාංශය
2004. 05. 07

පීඨාධිපතිණිය,
පශ්චාත් උපාධි පීඨය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

<u>ත්‍රිකුණාමල වරායේ ජාත්‍යන්තර වැදගතකම</u>

<u>එච්. සී. එල්. කල්දේරා මහතා - ශාස්ත්‍රපති උපාධි නිබන්ධය</u>

ඉහත නම් සඳහන් අපේක්ෂකයාගේ නිබන්ධය පිළබඳව 2004. 04. 20 දින පැවැති වාචික පරීක්ෂණයේදි පරීක්ෂකවරුන් පෙන්වා දෙනලද ~~සියලුම~~ අඩුපාඩු සියල්ලම ස්ම්පූර්ණයෙන්ම සංශෝධනය කොට ඇති බැව් උපදේශකවරයා වශයෙන් මම නිර්දේශ කරමි.

මෙයට

ඩී.එල්. අබේවර්ධන
උපදේශක

## පිළිගැන්වීම.

''තිස්පස් වසරකට වැඩි කළක් හමුදා සේවයේ නිරතවෙමින්

ත්‍රිකුණාමල ප්‍රදේශයේ

යටගියාව එළිපෙහෙළි කර දෙමින්

මා දිරිමත් කළ

සදාදරණීය පියාණන්ට......''

## ප්‍රණාමය.

☒ පර්යේෂණ නිබන්ධිකාවේ අධ්‍යයන උපදේශක ලෙස මා දිරි ගැන්වූ ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ ඉතිහාස හා පුරා විද්‍යා අධ්‍යනාංශයේ මහාචාර්ය ඩී.එල්.අබේවර්ධන මහතාට සහ මහාචාර්ය මාලනි ඇඳගම මහත්මියට.

☒ පර්යේෂණ කටයුතු කරගෙන යාමේදී මුහුණපාන්නට සිදුවූ බාධක, කම්කටොළු නිරාකරණය කර ගැනීමට සහය දෙමින් මා හට නන් අයුරින් උපකාර කළ කඩවැද්දුවේ මංගලසිරි ස්වාමින් වහන්සේට.

☒ වාර්තා ලිපි හා ග්‍රන්ථ සපයා දෙමින් හා නොයෙක් විට උපදෙස් දුන් ලුතිනන් කොමාන්ඩර් සෝමසිරි දේවේන්ද්‍ර මහතාට.

☒ මෙම පර්යේෂණයේදී වාර්තා කාණ්ඩ අප්‍රකාශිත ලේඛන ලිපිගොනු හා වාර්තා සපයමින් වසරකට වැඩි කලක් පහසුකම් සපයමින් මට සහයදුන් රාජ්‍ය ලේඛනාරක්‍ෂක දෙපාර්තමේන්තුවේ අධ්‍යක්‍ෂ
ආචාර්ය කේ.ඩී.ජී.විමලරත්න මහතාට සහ
සහාය අධ්‍යක්‍ෂ ලලිත් ගුණවර්ධන මහතාට.

☒ මහත් වෙහෙසක් දරා ලේඛන වාර්තා සොයාදීමට කටයුතු කළ
වසන්ත එගොඩවත්ත මහත්මිය, සුමනා අමරසිංහ ආරච්චි මහත්මිය,
දිළිනි ඇන්තනි ලියනගේ මහත්මිය, චමිලා රූපිකා ප්‍රියංගනී මහත්මිය,
එස්.විජේසේන මහතා, නල්ලතම්බි තංගවඩුවෙල්ලු මහතා හා
චන්ද්‍රසිරි පෙරේරා මහතා ඇතුලු
රාජ්‍ය ලේඛනාරක්‍ෂක දෙපාර්තමේන්තුවේ කාර්යමණ්ඩලයට.

☒ කැලණි විශ්වවිද්‍යාලයේ පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ අධ්‍යක්‍ෂ
සිරිනිමල් ලද්දුසිංහ මහතාට සහ
එහි පුස්තකාල පහසුකම් සපයා දෙමින් සහය දැක්වූ
ඉනෝකා දිල්හානි මහත්මියට, රසිකා මුරගේ මහත්මියට හා
සංජීවා පෙරේරා මහත්මියට.

☒ පිටපත් සකසා ගැනීමේදි පරිගණක පහසුකම් සපයමින් සහය දැක්වූ අජිත් මොහාන් පෙරේරා මහතාට හා ධාතු අනුරාධ පෙරේරා මහතාට.

☒ අපරමිත වෙහෙසක් දරා පරිගණකය මගින් පිටපත් මුද්‍රණය කර දීමට කටයුතු කළ අයි.එම්. ප්‍රසාද් ලසන්ත මහතාට.

☒ අත් පිටපත් සකසා ගැනීමේදි නන් අයුරින් උපකාර කළ මාගේ බිරිඳ වන අනෝමා ක්‍රිශාන්ති මහත්මියට.

**මාගේ ගෞරවපූර්වක ස්තුතිය පිරිනැමේ.**

## පටුන


| | | |
|---|---|---|
| I. | පිළිගැන්වීම | |
| II. | ප්‍රණාමය | II |
| III. | පටුන | III |
| IV. | සිතියම් හා සැලසුම් නාමාවලිය | IV |
| V. | චිත්‍ර හා ඡායාරූප නාමාවලිය | V-VI |
| VI. | ලිපි හා අභිලේඛන නාමාවලිය | VII |
| VII. | කෙටි යෙදුම් | VIII |
| VIII. | හැඳින්වීම | IX-XI |

පළමුවන පරිච්ඡේදය

| | | |
|---|---|---|
| 1. | ත්‍රිකුණාමල වරායේ පිහිටීමේ වැදගත්කම හා එහි ඓතිහාසික පසුබිම | |
| 1.1 | පිහිටීමේ වැදගත්කම | 1-16 |
| 1.2 | ඓතිහාසික පසුබිම | 17-34 |

දෙවන පරිච්ඡේදය

| | | |
|---|---|---|
| 2. | මුහුදු මාර්ග හා ආරක්ෂක උපක්‍රමවල වැදගත්කම | |
| 2.1 | මුහුදු මාර්ගවල ඇති වැදගත්කම | 35-60 |
| 2.2 | ආරක්ෂක උපක්‍රමවල ඇති වැදගත්කම | 61-69 |

තුන්වන පරිච්ඡේදය

| | | |
|---|---|---|
| 3. | නාවික හා යුදමය වැදගත්කම | |
| 3.1 | නාවික වැදගත්කම | 70-89 |
| 3.2 | යුදමය වැදගත්කම | 90-111 |

හතරවන පරිච්ඡේදය

| | | |
|---|---|---|
| 4. | ත්‍රිකුණාමල වරාය ආශ්‍රිත කලාපීය ගැටලු සහ අභිප්‍රායයන් | |
| 4.1 | ගැටලු | 112-117 |
| 4.2 | අභිප්‍රායයන් | 118-119 |

පස්වන පරිච්ඡේදය

| | | |
|---|---|---|
| 5. | සමාලෝචනය | 120-127 |

| | |
|---|---|
| සිතියම් සැලසුම් චිත්‍ර ඡායාරූප අභිලේඛන හා ලිපි | 128-159 |
| ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය, ප්‍රකාශන හා වාර්තා | 160-165 |
| පරිශීලනය කළ ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ ලේඛන | 166-171 |

<u>සිතියම් හා සැලසුම් නාමාවලිය.</u>


| | | |
|---|---|---|
| | | පිටුව |
| 1. ත්‍රිකුණාමල සිතියම. මාබල් ස්වේට් මළ මිනිසාගේ, කැලැපන්බර්ග්, සන්ග් මැලේ චීන, කෝඩ්, නිකල්සන් යන නම් වලින් හැඳින්වෙන බොකු වලින් ත්‍රිකුණාමවල වරාය ආවරණය වී පවතී. | - | 128 |
| 2. මුහුදු සිතියම් වල දක්වෙන දූපත් බොකු හා ගල්පර මාබල් බොක්ක කැලැපන්බර්ග් හා අලියාතුඩුවට අයත් මුහුදු ප්‍රදේශවල ගැඹුර මීටර වලින් දක්වේ. කැලැපන්බර්ග් හා මළ මිනිසාගේ හා ස්වේට් යන බොකු ආශ්‍රිතව සුදු කොමොට්, නඩේ මුන්නායි පාර් , හටන් උරිට්ට කල්ලු , පණ්ඩි එරිච්චි කල්ලු යන ගල්පර පිහිටා ඇති බව මුහුදු සිතියමෙහි දක්වේ. | - | 129 |
| 3. චීන හා කොඩ් බොක්ක ත්‍රිකුණාමල වරාය තුළ පිහිටි ඉතා වැදගත් බොකු දෙකකි එහි ස්ථාන නාම මුහුදු සිතියම් මඟින් පෙන්නුම් කරයි. | - | 130 |
| 4. ලන්දේසි කාර්මිකයකුගේ ත්‍රිකුණාමල වරායේ සිතියම. ( *Land Map And Survey* ) නම් ග්‍රන්ථයෙන් උපුටා ගන්නා ලදී. | - | 131 |
| 5. ත්‍රිකුණාමල බොක්කේ උතුරු වෙරළ තීරය හා නිකල්සන් බොක්ක මුහුදු සිතියම් වල සලකුණු කොට ඇති ආකාරය. | - | 132 |
| 6. බාහා-ඩොස්-ආකොස් යනුවෙන් ක්වීරොස් හැඳින්වූ වක දෙකක් සහිත බොක්ක හා කොස්තන්තීනු ද සාගේ ඒලීසා බලකොටුවේ සැලැස්ම. | - | 133 |
| 7. ත්‍රිකුණාමල වරායේ ඔස්ටන්බර්ග් පෙදෙස සැන්ඩි බොක්කේ සිට යෝර්ක් දූපත දක්වා දිවෙන කලපු ස්වරූපයගත් මුඩු බිම් ප්‍රදේශ මුස්ලිම් සමුද්‍ර ගම්මාන හා නෞකා අලුත් වැඩියා කිරීමේ මධ්‍යස්ථාන යයි අනුමාන කරන ස්ථාන හා මුස්ලිම් සොහොන් භූමි දක්වෙන ස්ථාන සලකුණු කොට ඇත. | - | 138 |
| 8. ඉබන් මජිඩ් හා සුලෙයිමාන් වැනි මුහුද යාත්‍රික ගවේශකයින් 14 හා 15 වන සියවස් වල ලංකාවේ වෙරළ ආශ්‍රිත ස්ථානනාම සලකුණු කොට ඇති අන්දම, ලංකාව වටා යාත්‍රා කිරීමේදී අක්ෂාංශක සාමාන්තර කිරීමෙන් ඔවුහු ස්ථාන නාම හඳුනා ගත්හ. | - | 140 |
| 9. ත්‍රිකුණාමල වරායේ සිට මහනුවර දක්වා විහිදිගිය බාධක සහිත මාර්ගයද වර්ෂ 1782 දී ප්‍රංශ සිතියමේ දක්වෙන ආකාරය. ( *Land Map And Survey* ) | - | 144 |
| 10. වික්ටෝරියා රැජිනගේ පාලන කාලයට අයත් ත්‍රිකුණාමල නාවික නටාකාංගණයේ සැලැස්ම වර්ෂ 1859 දී ( බ්‍රිතාන්‍ය ජලතරණ කාර්යාලය) | - | 146 |
| 11. මයිඩාන් තැනිතාලාව ඇතුළු ෆ්‍රෙඩ්රික් බලකොටු ප්‍රදේශය හා කෝණේශ්වරම් භූමි භාගය වර්ෂ 1894 දී යුදහමුදා ඉඩම් ලෙස වෙන්කර දීමේ සැලැස්ම. (ජාතික ලේඛනාරක්‍ෂක දෙපාර්තමේන්තුව) | - | 148 |

## චිත්‍ර හා ඡායාරූප නාමාවලිය


පිටුව

1. 18 වන සියවස මුල්භාගය තුළ ඊසාන දිග මෝසම් සුළං කලාපයෙන් ආරක්ෂා වීම සඳහා නිකල්සන් බොක්කේ නැංගුරම් ලා ඇති රුවල් නෞකා දක්වෙන චිත්‍රයක්. *(අනුග්‍රහය බ්‍රිතාන්‍ය ජලතරණ කාර්යාලය)* - 134

2. 16 වන සියවසයේ අරාබි මුස්ලිම් වෙළඳ නායකයින් විසින් ගොඩනගන ලදැයි සැලකෙන 19 වන සියවසේ නාවික අද්මිරාල් මැදුර. *(අනුග්‍රහය බ්‍රිතාන්‍ය ජලතරණ කාර්යාලය)* - 137

3. කමල් හෙවත් සිනත් නම් උපකරණය භාවිත කරමින් පොලාරිස් නම් වූ උතුරු තරුව මාර්ගයෙන් මුහුදේ යාත්‍රා කළ යුතු දිශාව සොයාගන්නා ආකාරය හා උතුරු තරුව මාර්ගයෙන් සොයා ගන්නා ලද දිශාවන්ට අනුව ත්‍රිකුණාමල වරායට පැමිණීම සඳහා ස්ථාන නාම සලකුණු වලට අනුව ගැටගසා ඇති කමල් නම් උපකරණයේ ලනුව. *( මදුරාසි කාලතුවක්කු හමුදාවේ සිටි කපිතාන් එච්.කොන්ග්‍රීව් විසින් අඳින ලද චිත්‍රයකි)* - 139

4. ඔස්ටන්බර්ග් කඳු වැටිය, ඔස්ටන්බර්ග් බලකොටුව හා නාවික නාටාකාංගණය වර්ෂ 1829 දී ත්‍රිකුණාමල වරාය තුළ දර්ශනය වන අන්දම. *( ලුතිනන් කොමාන්ඩර් ජේම්ස් කැනන් විසින් අඳින ලද චිත්‍රයකි)* - 141

5. උතුරු බොක්ක වරායට මායිම් වන කොඩිගහ තුඩුවේ සිට ෆ්‍රෙඩ්රික් බලකොටුව දක්වා ව්‍යාප්තව ඇති කොණේශ්වරම් කඳු වැටිය. *( ලුතිනන් කොමාන්ඩර් ජේම්ස් කැනන් විසින් අඳින ලද චිත්‍රයකි)* - 142

6. වර්ෂ 1829 දී සෝබාර් දූපත් *( ලුතිනන් කොමාන්ඩර් ජේම්ස් කැනන් විසින් අඳින ලද චිත්‍රයකි)* - 145

7. වර්ෂ 1988 දි ආර්.එම්.එල් කාලතුවක්කුව ඔස්ටන්බර්ග් කඳුපාමුල තිබූ සොයාගන්නා ලදී. එය නාවික නාටාකාංගණයට බෙල්ෆ්‍රී දොරටුවට වම් පසින් ස්ථාන කොටගෙන ඇති ආකාරය, ලුතිනන් කොමාන්ඩර් දේවේන්ද්‍ර විසින් 1989 දී එංගලන්තයේ උල්විච් යුදායුධ ගබඩාංගණයෙන් ගෙන්වා ගන්නා ලද ආර්.එම්.එල් කාලතුවක්කුව පිළිබඳ උපදෙස් අත්පොතක පිටපත් පිටුවක්. - 147

8. වර්ෂ 1916 දී ත්‍රිකුණාමල නාවික කඳවුර නැවත විවෘත කිරීමේදී අද්මිරාල් මන්දිරය පැවති ආකාරය - 149

9. වර්ෂ 1906 දී ත්‍රිකුණාමල නාවික කඳවුර වසාදැමීමට ආසන්න කාලයේදී නාවික කොමසාරිස් ගොඩනැගිල්ල. - 150

10. වර්ෂ 1915 දී ත්‍රිකුණාමල නාවික කඳවුරට පිවිසෙන කැරේජ් නමින් හැඳින්වූ මාර්ගය හා ගල් අඟුරු බාන නෞකාවක් ඈතින් දිස්වේ. - 151

11. වර්ෂ 1935 දී ඔස්ටන්බර්ග් උතුරු තුඩුවෙහි ( Reagent Bettary) කාලතුවක්කු සවිකිරීම. - 152

12 එම - 153

13 වර්ෂ 1935 දී හූඩ්ස් ටවර්හී කාලතුවක්කු සවිකිරීම. - 154

14 වර්ෂ 1935 දී හූඩ්ස් ටවර්හී නිරීක්ෂණ ගොඩනැගිල්ල ඉදිකරණ බ්‍රිතාන්‍ය ඉංජිනේරු කාර්මිකයින් පිරිසක්. - 155

පිටුව

15 වර්ෂ 1935 දී මාර්තු මස 12 වන දින ඔස්ටන්බර්ග් තුඩුවේ ස්ථානගත කිරීම සඳහා ඇතුන් ලවා කාලතුවක්කු ඇද්ද වීම. ජෝන් බෝලින් හා ඩේවිඩ්සන්ගේ වාර්තාවලට අනුව මෙම ඡායාරූපයේ දක්වෙන රෝසි නමින් හැඳින්වූ එක් ඇතින්නක් කෝපයට පත්වී ඇත් ගොව්වකු මරාදමූ බව සඳහන් වේ.- 156

16 වර්ෂ 1942 දෙසැම්බර් මස 09 දින පෙරවරු 1015 පැයට පමණ එච්.එම්.එස් හර්මිස් නෞකාව ජපන් බෝම්බ ප්‍රහාර හමුවේ මඩකලපු ප්‍රදිපාගාරයට සැතපුම් පහක් ඈතින් මුහුදු බත් වන ආකාරය උපලුතිනන් චාල්ස් මොගන්ගේ කැමරාවට හසුවූ අන්දම. - 157

17 හර්මිස් නෞකාවේ ආරක්ෂාවට ගිය ජපන් ප්‍රහාර හමුවේ මුහුදු බත් වූ ඔස්ට්‍රේලියානු නාවික හමුදාවට අයත් වැම්පයර් නෞකාවේ ඡායාරූපයක් *( රෙක්ස් මොගන්ගේ හර්මිස් ඇඩ්වෙන්චර් ග්‍රන්ථය ඇසුරෙන් )* - 158

18 ත්‍රිකුණාමල වරායේ චිනන්වාඩි හා චීනවරායට ඇති ඉන්ධන ටැංකි සංකීර්ණය ගුවනට දිස්වන අයුරු. - 159

<u>අභිලේඛන හා ලිපි නාමාවලිය.</u>


| | | | පිටුව |
|---|---|---|---|
| 1. | මසුන් දෙදෙනා සහිත පාණ්ඩ්‍ය ලාංඡනය හා දෙමළ අක්ෂර සහිත ෆේඩ්රික් බලකොටුවේ සෙල්ලිපිය. | - | 135 |
| 2. | ක්‍රි.වර්ෂ 1529 දී නිකල්සන් බොක්කට අයත් යැයි සැලකෙන ත්‍රිකුණාමල නාවික කඳවුරේ ඉංජිනේරු දෙපාර්තමේන්තු භූමියෙන් හමුවූ සොහොන් ගල් අභිලේඛනය, ලුතිනන් කොමාන්ඩර් එස්.දේවේන්ද්‍ර විසින් ඉන්දියාවේ නාග්පූර් පර්යේෂණ ආයතනයට යවා නිගමනය කරගත් තොරතුරු ඇතුළත් වාර්තාවේ පිටපතක්. | - | 136 |
| 3. | ඔස්ටන්බර්ග් කඳුපාමුල මුහුදු ප්‍රදේශයේ නාවික කඳවුරක් ඉදිකිරීම සම්බන්ධව අද්මිරාල් සැමුවෙල් හුඩ්ස් වෙත ලිවර් පුල්හී අර්ල් වරයා විසින් දැනුම් දෙන ලද ලිපයක පිටපතක්. *(රාජ්‍ය ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව)* | - | 143 |

## කෙටි යෙදුම්

| | | |
|---|---|---|
| 1. | AHRNT | *Admiralty House and Royal Navy at Trincomalee* |
| 2. | ASOC | *Archaeological Survey of Ceylon* |
| 3. | CAAR | *Ceylon Almanac and Annual Register* |
| 4. | CALENDAR | *The Ceylon Calendar for the Year of Lord* |
| 5. | CAR | *Ceylon Administration Report* |
| 6. | CBB | *The Ceylon Blue Book* |
| 7. | CGG | *Ceylon Government Gazette* |
| 8. | CV | *The Culavansa* |
| 9. | JRAS( C.B ) | *Journal of Royal Asiatic Society ( Ceylon Branch)* |
| 10. | MV | *The Mahavamsa* |
| 11. | NHT | *Naval History of Trincomalee* |
| 12. | PF | *Pending File* |
| 13. | PLC | *Papers of Legislative Council* |
| 14. | RG | *Record Group* |
| 15. | RNRB | *Royal Navy Record Book* |
| 16. | SSRS | *Sri Lanka and The Silk Road of The Sea* |
| 17. | UCHC | *University of Ceylon History of Ceylon* |
| 18. | WCIP | *West Cost of India Pilot* |
| 19. | ම.ව | *මහාවංශය* |
| 20. | දී.ව | *දීපවංශය* |
| 21. | ශ්‍රී.ලං.වි.ල.ඉ | *ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයේ ලංකා ඉතිහාසය* |

# හැඳින්වීම.

ළමාවියේ සිට ත්‍රිකුණාමල ප්‍රදේශයේ ජීවත් වෙමින් උකහාගත් අත්දැකීම් සම්භාරය හා ඉන් හට ගත් චිත්තරූප සමුදාය ත්‍රිකුණාමල වරායේ ජාත්‍යන්තර වැදගත්කම නම් වූ පර්යේෂණ නිබන්ධය සකස් කිරීමේහිලා මා පෙළඹ වීය.

දෙවන ලෝක යුද සමයේ ලංකා පාබල රෙජිමේන්තුවේ කෝප්‍රල් නිලයේ සොල්දාදුවකු ලෙස සේවය කොට පසුව ඉන් ඉවත්ව බ්‍රිතාන්‍ය අද්මිරාල්ටිය යටතේ පැවති රාජකීය නාවික පොලිස් සේවයට බැඳුණු මාගේ පියා අප පවුලේ සාමාජිකයින් සමඟ ත්‍රිකුණාමල ප්‍රදේශයේ පදිංචියට පැමිණියේ වර්ෂ 1952 දීය. එතැන් පටන් දහසය වසරක කාලයක් තුළ චිනන්වාඩි, චීන වරාය නාවික තාටාකාංගණය, මංකි බ්‍රිජ් හා ප්ලාන්ටන් පොයින්ට් යන ප්‍රදේශවල පියාගේ රාජකාරි ස්වභාවය අනුව අපි ජීවත් වුනෙමු. චීනන්වාඩි ප්‍රදේශයේ පදිංචිව සිටි කාලයේදි බහ තේරෙන වයසේ මා පසුවුවත් එම ප්‍රදේශය වසාගෙන පැවති වනාන්තර පද්ධතිය හා එහි තැනින්තැන පිහිටි තෙල්ටැංකි වල ස්වරූපය මා සිතෙහි රැඳි තිබිණි. වර්ෂ 1953 දී අපි චීන වරාය ප්‍රදේශයට පදිංචියට ගියෙමු. සයිරන් නලා හඬට තෙල් ගබඩා සංකීර්ණයේ සේවය සඳහා යන එන බ්‍රිතාන්‍ය ජාතිකයින් හා සිවිල් සේවකයින් ගමන්කරන මාර්ගයක් ආසන්නයේ අප නිවස පිහිටා තිබූ බැව් මට මතකය. විශාල බෝට්ටු වැඩපොළක් සහිත ගබඩාංගණ ප්‍රදේශයක් වූ චීනවරායේ ඉන්ධන ජැටියට ඉන්ධන ලබාගැනීමට එන නෞකා නිතර මාගේ නෙත ගැටුණු සාමාන්‍ය දර්ශනයක් විය.

ත්‍රිකුණාමලයේ සාන්ත අන්තෝනි මිශ්‍ර පාසලෙන් මම මූලික අධ්‍යාපනය ලැබුවෙමි. රාජකීය නාවික පොලිස් සේවයට අයත් පුද්ගලයින්ගේ දරුවන්ට පාසල් යාම සඳහා වෙන්කර ඇති පාසල් ට්‍රක් රථයෙන් මමද පාසල් ගියෙමි. මෙම පාසල් ට්‍රක් රථය මංකි බ්‍රිජ් චීනන් වාඩි චීනවරාය ලව්ලේන් යන කඳවුරු වලට ගොස් පාසල් දරුවන් එකතුකොට ගෙන ත්‍රිකුණාමල ප්‍රදේශයේ පාසල් කරා ගෙනයාම නිසා නාවික ගබඩාංගණවල ස්වරූපයත් ත්‍රිකුණාමල නගරයේ ඇති මයිඩාන් හෙවත් මුත්තුවලි තැනිතලාවත් ස්ටීවන් සුසාන භූමිය ෆෙඩ්රික් බලකොටුව හා ත්‍රිකුණාමල වරායත් මට නිතර දෙවේලේ මුණගැසුණු වස්තූන් විය.

වර්ෂ 1955 දී ත්‍රිකුණාමල නාවික කඳවුරට මාරුවක් ලැබ අපි පදිංචියට ගියෙමු. එවකට එය යුද කඳවුරක් බව මා නොදන සිටියත් බ්‍රිතාන්‍ය ජාතිකයින්ට පමණක් ආවේණික වූ සුරපුරයක් යන හැඟිම මා තුළ පැවතිණි. රාත්‍රි සාමාජ ශාලා, චිත්‍රපට ශාලා හා අවන්හල් කරා ඇදෙන බ්‍රිතාන්‍ය ජාතිකයින් මම දක ඇත්තෙමි. සති අන්තවලදී වරායේ ඇති විවිධ නෞකා වලින් පැමිණෙන තූර්ය වාදක කණ්ඩායම් කඳවුරේ ක්‍රීඩා පිටියට රැස්වී පවත්වන සංදර්ශන දෙස මාද බලාසිටි අවස්ථා එමටය. නිතර වරායේ නෞකා වලින් ජැටිවලට පැමිණෙන බෝට්ටු මැලේ බොක්කේ නතරකොට ඇති මුහුදු අභස්යානා දෙස මම විමසිල්ලෙන් බලා සිට ඇත්තෙමි. සැදෑ සමයේ ආරෝග්‍යශාලා සංකීර්ණයෙන් සේවය නිමාකොට රත්පැහැගත් පාපැදි වලින් තම නවාතැන් කරා ඇදෙන කිරිල්ලියන් සේ පියාඹා යන විදේශීය සුරූපි හෙදි කාන්තාවන්ද මෙම කඳවුර තුළ මාගේ මතකය අවදි කළ සුන්දර දර්ශනයක් විය.

වර්ෂ 1956 පියාගේ මාරු වීමත් සමඟ මංකී බ්‍රිජ් ගබඩාංගණ කඳවුරේ පදිංචියට අපි ගියෙමු. ඝණ වනාන්තර පද්ධතියකින් හෙබි මෙම ප්‍රදේශයේ අලි ඇතුන් පවා ගහන විය. වර්ෂ 1957 යුද කඳවුරු බාරදීමේ ප්‍රතිපත්තිය යටතේ මංකී බ්‍රිජ් කඳවුරේ බෝම්බ ගබඩාංගණ ඉවත්කරන

ආකාරය හා ඒවා නැව්ගත කිරීම සඳහා ගෙන යන ආකාරය මා බොහෝ අවස්ථාවල දක ඇත්තෙමි. මංකි බ්‍රිජ් ගබඩාංගණ කඳවුරේ සිට පෙර පරිදි පාසල් ට්‍රක්රථයෙන් පාසල් ගමන අරඹන විට මෙම යුද කඳවුර පිළිබඳව කිසියම් හෝ දැනුම් තේරුම් ඇති තත්තවයක මා පසු වූ බැවින් බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයේ ගරා වැටෙන සිහිවටන පිළිබඳව මාතුළ පාලුවක් කණගාටුවක් දනේනට විය. බොහෝ අවස්ථාවල පාසල් ට්‍රක් රථය පැමිණෙන තෙක් බලා නොසිට එයට නැගීම සඳහා මයිඩාන් තැනිතලාව හරහා ෆෙඩ්රික් බලකොටුවට යන මා තුළ එහි අස්සක් මුල්ලක් නැර ඇවිදීමේ සිරිතක්ද පැවතිණි. මෙවැනි අවස්ථාවල මා හිඳ හිට කෝණේශ්වරම් පූජා භූමියටද ගොස් ඇත්තෙමි. මා උසස් පෙළ සඳහා විෂයක් ලෙස ඉතිහාසය හදරන කාලයේදී ළමා වියේ මා ගමන් කර ඇත්තේ ෆෙඩ්රික් බලකොටුවේ ඇමස්ටර්ඩෑම් හා හැරුන් බැස්ටියන් වල බවත් කෝණේශ්වර භූමියේ මා දක ඇත්තේ රාවණාගේ පැළුම හා ෆ්‍රැන්සිනා වැන්රිස්ගේ අනුස්මාරකය බවත් අවබෝධ කර ගතිමි.

වර්ෂ 1957 ත්‍රිකුණාමල නාවික කඳවුර වසාදමා එය රාජකීය ලංකා නාවික හමුදාවට පැවරීමෙන් පසු රාජකීය නාවික පොලිස් සේවයේ සාමාජිකයින්ද රාජකීය ලංකා නාවික හමුදාවට බඳවාගත් බැවින් අපගේ පියාණන්ටද ඊට අනුයුක්ත වීමට සිදුවිය. නාවික හමුදාවෙන් ලැබුණු නිවාස පහසුකම් යටතේ යාඩ් බොක්කට මායිම් වූ ජ්ලාන්ටන් පොයින්ට් ප්‍රදේශයේ කොකනට් ගෘෘ නම් ස්ථානයේ නිවසකට අප පදිංචියට ගියෙමු. වර්ෂ 1958 දී ත්‍රිකුණාමලයේ සාන්ත ජෝශප් විද්‍යාලයට ඇතුලත් වී අධ්‍යාපනය ලබන කාලය තුළ ඕර්ස් හිල් කඳුවැටිය හරහා පාසල් යාමට මම පුරුදුව සිටියෙමි. අතිවිශාල වූ ගොඩනැගිල්ලක් ඕර්ස් හිල් කඳුවැටියේ වනාන්තර ප්‍රදේශයක වසා දමා ඇත්තේ කුමක් නිසාද යන ප්‍රශ්නයට පිළිතුරක් ලාබගැනීමට මා හට ද නොහැකි විය. මෙම පර්යේෂණය සඳහා ජාතික ලේඛනාරක්‍ෂක දෙපාර්තමේන්තුවේ ලේඛන පරීක්‍ෂා කිරීමේදි එම ගොඩනැගිල්ල 19 වන සියවසයේ කොළරා රෝගීන් සඳහා වෙන්කර ඇති ආරෝග්‍ය ශාලාවක් බව මම අවබෝධකර ගත්තෙමි. කොකනට් ගෘෘ ප්‍රදේශයේ වාසය කරන කාලය තුළ උදෑසන පමණක් නාවික හමුදාව විසින් සපයන ලද බෝට්ටුවකින් මම පාසල් ගියෙමි. ජ්ලාන්ටන් පොයින්ට් ජැටියේ සිට ත්‍රිකුණාමල වරාය හරහා නාවික තාටාකාංගණයේ පේපර්පෝට් ජැටිය වෙත බෝට්ටුවෙන් ගොස් දිනපතා පාසල් යාමට මමද පුරුදු වී සිටියෙමි. එම කාලය තුළ වරායේ ස්වාභාවය, පවුඩර් ගල්පර, යොර්ක් දූපත හා කව්වේරි ජැටිය හඳුනාගත් ත්‍රිකුණාමල වරායේ අමතක කළ නොහැකි ස්ථාන ලෙස මා තුළ තැන්පත් වී පැවතුණි.

වර්ෂ 1958 සිට වසරකට වරක් බ්‍රිතාන්‍ය මිත්‍ර පාක්ෂික රටවල නෞකා ඒකාබද්ධව යුද අභ්‍යාසක් සඳහා ත්‍රිකුණාමල වරායට පැමිණෙන අවස්ථාද මම දක ඇත්තෙමි. යුද නෞකා වලින් පිරියන ත්‍රිකුණාමල වරාය කොතරම් වැදගත් වරායක්ද යන හැගීමද මා තුළ පැවතුණි. වර්ෂ 1971 රාජකීය ලංකා නාවික හමුදාවට බැඳි ත්‍රිකුණාමල නාවික කඳවුරට මාරුවීම් ලැබ ගිය අවස්ථාවේදී ඔස්ටන්බර්ග් වැපල් හිල් හුඩ්ස් ටවර් යන කාලතුවක්කු අංගණ පිළිබඳව විමසා බැලීමේ කුතුහලක් මා තුළ ඇති විය. නාවික කඳවුරේ පැරණි ද්‍රවිඩ ජාතික සේවකයින්ගෙන් තොරතුරු විමසා ඒවා රැස්කරගත් මම ග්‍රන්ථයක් සම්පාදනය කිරීමට උත්සහා දැරුවෙමි. එවකට ත්‍රස්තවාදී ක්‍රියා ත්‍රිකුණාමල ප්‍රදේශයට එල්ල වීම හේතුවෙන් ඒ සඳහා ඇති ඊට ප්‍රස්ථාද ඇහිරී ගියේය. වර්ෂ 1980 සිට 1985 දක්වා කාලය තුළ මම ලුතිනන් වරයෙකු ලෙස ත්‍රිකුණාමල නාවික කඳවුරේ සේවය කළෙමි. එම කාලය තුළ නාවික තාටාකාංගණයේ පැරණි කාලතුවක්කු වළදමා ඇති ස්ථාන පිළිබඳව සොයාබලා වාර්තාවක් ද සකස් කළෙමි. වර්ෂ 1990 ඔස්ටන්බර්ග් බලකොටුව ආශ්‍රිත වනාන්තර ප්‍රදේශයේ සුසාන භූමියක නටබුන් සොයා ගැනීමට හැකි විය. 19 වන සියවසේ ත්‍රිකුණාමල වරාය ආශ්‍රිතව උග්‍රව පැවති වසූරිය හා කොළරාව යන රෝග

වැළඳීමෙන් මියගිය ලන්දේසී සෙබලුන්ගේ බිදීගිය සොහොන් කොත් එහි ඇති බවත්ද මා හට ප්‍රත්‍යක්ෂ විය.

වර්ෂ 1991 දී ලුතිනන් කොමාන්ඩර් දේවේන්ද්‍ර මහතා විසින් ඔස්ටන්බර්ග් බලකොටුවට යාබඳව ඇති ගලින් බඳින ලද චතුරස්‍රකාර ළිඳක් වැනි කොටස මෝසම් වර්ෂා කාලවලදී බලකොටුවට අවශ්‍ය ජලය රැස්කරන ජලටැංකියක් බව හඳුනා ගනු ලැබීය. මේ හා සමාන හැඩයෙන් යුත් ජල ටැංකියක් රවුන්ඩ් දූපතේ ප්‍රදීපාගාරයට යාබඳවද ඇති බව පසුව මම සොයා ගතිමි. එහෙත් එය කවුරුන් විසින් ගොඩනඟන ලද්දක්ද යන්න තොරතුරු අනාවරණය කර ගැනීමට අපහසු විය. ඒ හැර වැපල් තුඩුවෙන් මුහුදට නෙරා ගිය බිම් කොටසේ බිං ගෙයක් ඇති බැව් සිවිල් සේවකයින්ගෙන් ලද තොරතුරු වලට අනුව හඳුනා ගත්තෙමි. මෙම බිං ගෙයට ඇතුලුවන දොරටුව මුදුනේ බ්‍රිතාන්‍ය ලාංඡනය දක්නට ලැබේ. බිං ගේ බිත්ති වල වර්ෂ 1814 යනුවෙන් ලියා ඇති පැරණි ඉංග්‍රීසි අකුරු අතර නම් ගම්ද විය. මෙය බ්‍රිතාන්‍ය සෙබලුන් විසින් අඳින ලද ඒවා ලෙස සැලකේ. 18-19 වන සියවස මුල් භාගය තුළ වැපල් හිල් කඳුවැටියේ කාලතුවක්කු අංගණ ඉදිකිරීමෙන් පසුව එය ප්‍රයෝජනය සඳහා වෙඩි බෙහෙත් ගබඩා කිරීමට මෙම බිං ගෙය තනන්නට ඇතැයි නිශ්චය කළ හැක. වර්ෂ 1992 දී වැපල් හිල් කාලතුවක්කු අංගණ ප්‍රදේශය පිළිබඳව සමීක්ෂණයක යෙදුණු මා හට 17 හා 18 වන සියවස් වල ඔස්ටන්බර්ග් හා ෆ්‍රෙඩ්රික් බලකොටු අතර පිහිටි වැපල් තුඩුවේ ඇති වෙනත් බලකොටුවක ලක්ෂණද සොයා ගැනීමට හැකි විය.

වර්ෂ 1995 දී ශ්‍රී ලංකා නාවික හමුදාවේ ඉතිහාසය නමින් රූපවාහිනි වාර්තා වැඩසටහනක් මා විසින් සකස් කළ අතර ත්‍රිකුණාමල නාවික කඳවුරේ යටගියාව සම්බන්ධයෙන් සොයගත් ඓතිහාසික තොරතුරු ද ඊට ඇතුළත් කරනු ලැබුවෙමි. 1996 සහ 1997 යන වර්ෂ වල දෙසැම්බර් මස 09 වන දින **"නිම්වළල්ල අභියස"** නමින් රූපවාහිනි සංස්ථාව විසින් මෙම වැඩසටහන ප්‍රචාරය කරන ලදී.

ත්‍රිකුණාමල වරායේ ජාත්‍යන්තර වැදගත්කම යන පර්යේෂණ නිබන්ධය සකස් කිරීමේදී ඉහත අධ්‍යයනයන් මා හට උපකාර වූවා සේම ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ අප්‍රකාශිත ලේඛන හා වාර්තා කාණ්ඩ වලට අයත් තොරතුරු හා සැසඳීමේදී ඒවායේ සත්‍යතාව සනාථ කර ගැනීමටද අවස්ථාව උදාවිය.

## පළමුවන පරිච්ඡේදය

## <u>ත්‍රිකුණාමල වරායේ පිහිටීමේ වැදගත්කම හා එහි ඓතිහාසික පසුබිම</u>

### පිහිටීමේ වැදගත්කම

භූගෝලීය සාධක ඉතිහාසය ගොඩනැගීමට හේතු කාරක වේ නම් ස්වභාවික පිහිටීමේ වැදගත්කම මහාද්වීපයක හෝ අධිරාජ්‍යයක ඉරණම තීරණය කරයි. මෙම ආකල්පය ත්‍රිකුණාමල වරායේ ඓතිහාසික ධූරාවලිය විසින් ගොඩනගන ලද්දකි. ඒ අනුව ලොව විශාලම ස්වාභාවික වරායන් අතර ත්‍රිකුණාමල වරාය පස්වන ස්ථානයෙහිලා සැලකේ.[1] එහෙත් ස්වාභාවිකව පිහිටීම විසින් උරුම කරන ලද දායාද හා සැසඳීමේ දී ලොව අන් සියලුම ස්වාභාවික වරායන් අතර එය ප්‍රමුඛස්ථානයක් දරන බව පෙනේ. ඉන්දියානු සාගර කලාපයේ අරාබි මුහුද හා බෙංගාල බොක්ක වෙන් කරන සීමාවන් කේන්ද්‍ර කොටගෙන පිහිටි ශ්‍රී ලංකාවේ ඊසාන දිග මුහුදු තීරය මෙම වරායට පසුබිම් වේ. පූර්ණ වශයෙන් ආවරණය වූ කඳු පද්ධති හා මුහුදු තුඩු වලින් එකිනෙක වෙන් කරනු ලබන මුහුදු බොකු සහිත වෙරළ තීරයන් ගෙන් සමන්විත වීම හේතුවෙන් සුවිශේෂවූ භූවිෂමතා ලක්ෂණ පෙන්නුම් කරයි. නිරක්ෂීය ආසන්නතාව නිසා කර්කශක ශුෂ්ක දේශගුණයක් වරාය අභ්‍යන්තරයට බලපා ඇතත් කල්පාන්තර ඉන්දීය සම්භවයකින් බිඳීගිය පරිසර පද්ධතීන් ද දක්නට ලැබේ. ඊසාන දිගින් බෙංගාල බොක්කටත් නැගෙනහිර දිගින් අග්නිදිග ආසියානු දූපත් කලාපයටත් මුහුණ ලා පිහිටීමෙන් ඈත පෙරදිග දක්වා දිවෙන මුහුදු මාර්ග පාලනය කළ හැකි ප්‍රවණතාවක් මෙම වරායේ ස්වාභාවික පිහිටීම තුළ ගැබ්ව පවතී. ඊසාන දිග මෝසම් සුළං හා සාගර ප්‍රවාහයන්ගේ බලපෑම් මත බෙංගාල බොක්කේ උපදින සර්පිරාකාර කැළඹීම් මගින් අක්ෂාංශක ආධාරයෙන් නිරක්ෂය හරහා ගමන් කරන රුවල් නෞකා වලට බාධා එල්ල වේ. ඊට එරෙහිව ඉන්දියන් සාගරය තුළ ආවරණතාව හා ආරක්ෂාව සැපයිය හැකි එකම වරාය වන්නේ ද ත්‍රිකුණාමල වරාය පමණි. එබැවින් මෙම වරාය වටා ඇති කඳුවළල්ල යුද උපක්‍රම හා විවිධ යුද තාක්ෂණික අරමුණු සඳහා ද කෙම්බිමක් විය. එහෙත් අන්තර්නයන ප්‍රතිපත්තියක් තුළින් අසල්වැසි හා යුරෝපීය ජාතීන් විසින් මෙම වරායේ ස්වාභාවික පිහිටීම උරා බීගත් ආකාරය ඉතිහාසයේ කැඩපත තුළින් දැකීම ත්‍රිකුණාමල වරායේ ජාත්‍යන්තර වැදගත්කම යනුවෙන් හඳුන්වමි.

යුරෝපීය විද්වතුන් විවිධ දෘෂ්ටිමය ආකල්පයන් යටතේ ත්‍රිකුණාමල වරායේ ප්‍රතිරූපය උරගා බැලීමට වෙර දරීය." කුඩා දිවයිනක පිහිටි මෙම වරාය ඉන්දීය වාණිජ කටයුතු වල ආරක්ෂාව සඳහා වැදගත්වේ. ඉන්දියන් සාගරයේ මධ්‍ය ලක්‍ෂයක පිහිටි බැවින් කුමන හෝ මෝසම් සෘතුවකදී වුවත් පහසුවෙන් නෞකා ඇතුල්වීමට හෝ පිටවීමට ඇති හැකියාව සඳහා පහසුකම් ඇත. සමුද්‍රාසන්න නාවික ගබඩා හෝ උතුමාණන් වහන්සේගේ නැව් හමුදා සහිත බලඇණි රඳවා තැබීමට ඇති අවකාශය නිසා ඉන්දියන් සාගරයේ අන් කිසිම වරායක් මීට සමකළ නොහැකිය." යනුවෙන් ජේම්ස් කොඩිනර් කළ ප්‍රකාශය එච්.ඒ. කෝල්ගේට් ***(H.A. Colgate)*** විසින් ද අනුමත කරන ලදී.[2] එමර්සන්ට් ටෙනන්ට් දෙවන ජිබ්‍රෝටර්යක් බවට පත්වන බොම්බාය වරාය නිසා ත්‍රිකුණාමල වරාය සංවර්ධනය වන බැව් ප්‍රකාශ කළේය.[3] "යමෙක් ත්‍රිකුණාමල වරාය පාලනය කරයි ද ඔහු මුළු ආසියාවම පාලනය කරයි." යන ඇල්ෆ්‍රඩ් මොහාන්ගේ මතයද ජිබ්‍රෝටරයෙන් ඔබ්බට ගියේය. එබැවින් මුහුදු හතක් පාලනය කළ හැකි එකම යතුර ***(key to the seven seas)*** බවට ත්‍රිකුණාමල වරාය පත්විය. මෙම ආකල්ප බ්‍රිතාන්‍ය

1. *Mendis* : The Advent of The British to Ceylon, p 80
2. *Colgate*, p 1
3. *Tennent*, p 945